සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| පෙරදිග සංගීතය I<br>கீழைத்தேய சங்கீதம் I<br>Oriental Music I | **54 S I** | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |
|---|---|---|

**විභාග අංකය :** ................................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1 - 5 | |
| 02 | 6 - 13 | |
| 03 | 14 - 21 | |
| 04 | 22 - 29 | |
| 05 | 30 - 37 | |
| 06 | 38 - 47 | |
| 07 | 48 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** පැරණි වේද ග්‍රන්ථයන්හි සඳහන් නාද ස්ථාන තුන **නිවැරදි ව** දැක්වෙන වරණය තෝරන්න.
(1) ආර්චික, ගාථික, අනුදාත්ත
(2) අනුදාත්ත, සාමික, උදාත්ත
(3) උදාත්ත, අනුදාත්ත, ස්වරිත
(4) ස්වරිත, ස්වරාන්තරිත, ආර්චික
(5) ආර්චික, ගාථික, උදාත්ත
(..3..)

**2.** භාරතීය සංගීතයෙහි ශ්‍රැති නාම සහිත ව හඳුනා ගෙන ඇති4සම්පූර්ණ ශ්‍රැති ස්ථාන සංඛ්‍යාව
(1) 7 කි. (2) 8 කි. (3) 12 කි. (4) 21 කි. (5) 22 කි. (..5..)

**3.** ස ම රි ග, රි ප ග ම, – – – – ආදී වශයෙන් පිළිවෙලින් යෙදෙන ස්වර අභ්‍යාසයෙහි මීළඟට යෙදෙන පියවරට අදාළ ස්වර හතර ඇතුළත් වරණය තෝරන්න.
(1) ග ම ප ධ (2) ග ම ධ ප (3) ග ප ම ධ (4) ග ධ ම ප (5) ග ධ ප ම (..4..)

**4.** හින්දුස්තානි සංගීත ථාට 10 අතර විකෘති ස්වර දෙකක් වශයෙන් සහ එකක් වශයෙන් යෙදෙන ථාට දෙකක් පිළිවෙලින් සඳහන් කර ඇති වරණය තෝරන්න.
(1) තෝඩි - කාෆි
(2) භෛරව - ආසාවරි
(3) භෛරවී - බිලාවල්
(4) මාර්වා - ඛමාජ්
(5) පූර්වී - කල්‍යාණ
(..4..)

**5.** ගති, මිති, ලය යනාදී සංකල්ප අනුව, මිතියෙන් සමාන තාල තුනක් පෙන්නුම් කෙරෙන වරණය තෝරන්න.
(1) ධමාර්, චෞතාල්, දීප්චන්දි
(2) දීප්චන්දි, ඒක්තාල්, තිලවාඩා
(3) තිලවාඩා, ත්‍රිතාල්, පංජාබි
(4) පංජාබි, හිංචි, ඛෙම්ටෝ
(5) ඛෙම්ටෝ, දාදරා, ජප්තාල්
(..3..)



CamScanner

6. රාග ජාතිය පිළිබඳ මත කිහිපයක් පෙන්නුම් කර ඇති නිර්දේශිත රාගය කුමක් ද?
   (1) ආසාවරී (2) භෛරව (3) බාගේශ්‍රී (4) ජයජයවන්ති (5) ජෞනපුරී (...3...)

7. මාල්කෞන්ස් සහ හංසධ්වනි යන රාග දෙකෙහි සමානතාවයක් පෙන්නුම් කෙරෙන කරුණ ඇතුළත් වරණය තෝරන්න.
   (1) මේලය (2) වාදී ස්වරය (3) සංවාදී ස්වරය
   (4) රාග ජාතිය (5) ගාන සමය (...4...)

8. අවරෝහණයෙහි විකෘති ස්වර එකක් පමණක් යෙදෙන නිර්දේශිත රාගයක් වන්නේ
   (1) දේස් රාගයයි. (2) ආසාවරී රාගයයි.
   (3) ජයජයවන්ති රාගයයි. (4) බාගේශ්‍රී රාගයයි.
   (5) මාල්කෞන්ස් රාගයයි. (...1...)

9. මධ්‍ය ස්වර සප්තකයේ මධ්‍යම ස්වරයෙන් ඉහළට අයත් කිසිදු ස්වරයක් ඇතුළත් **නො වන** මුඛ්‍යාංගයකින් යුතු රාගයක් තෝරන්න.
   (1) ජයජයවන්ති (2) බාගේශ්‍රී (3) ආසාවරී
   (4) දේස් (5) භෛරව (...1...)

10. බාගේශ්‍රී, මාල්කෞන්ස්, භෛරව, ආසාවරී, ජයජයවන්ති යන **රාග සියල්ලෙහි ම** නිශ්චිත ව හෝ විවාදී ව හෝ වෙනත් කුමන ආකාරයකට හෝ යෙදෙන විකෘති ස්වරය තෝරන්න.
   (1) කෝමල රිෂභය (2) කෝමල ගාන්ධාරය (3) තීව්‍ර මධ්‍යමය
   (4) කෝමල ධෛවතය (5) කෝමල නිෂාදය (...5...)

● අංක **11** සිට **13** දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු තේරීම සඳහා පහත ස්වර ප්‍රස්තාරය ඇසුරු කරගන්න.

| x | 2 | 0 | 3 |
|---|---|---|---|
| ම‌ධ (මධ) නිධ (නි‌ධ) ස්‍ - | (නි) - නි ධ | ම ප ධ | ^මගු - රි ස |

11. ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන රාගය සහ එම රාගයට අදාළ ආගන්තුක (විවාදී) ස්වරය වන්නේ, පිළිවෙලින්
   (1) බාගේශ්‍රී රාගය සහ පංචමයයි.
   (2) ජයජයවන්ති රාගය සහ පංචමයයි.
   (3) බාගේශ්‍රී රාගය සහ කෝමල නිෂාදයයි.
   (4) ජයජයවන්ති රාගය සහ කෝමල ගාන්ධාරයයි.
   (5) බාගේශ්‍රී රාගය සහ කෝමල ගාන්ධාරයයි. (...1...)

12. ස්වර ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරෙන වක්‍ර ස්වරය සහ 'කන්' ස්වරය වන්නේ, පිළිවෙලින්
   (1) පංචමය සහ කෝමල ගාන්ධාරයයි.
   (2) කෝමල ගාන්ධාරය සහ කෝමල නිෂාදයයි.
   (3) කෝමල නිෂාදය සහ මධ්‍යමයයි.
   (4) මධ්‍යමය සහ කෝමල ගාන්ධාරයයි.
   (5) පංචමය සහ මධ්‍යමයයි. (...3...)

13. ස්වර ප්‍රස්තාරයට අනුව අදාළ තාලය සහ මූර්ඡනා යෙදෙන තාල ස්ථානය වන්නේ, පිළිවෙලින්
   (1) ජප්තාලය සහ දෙවන අනුතාල ස්ථානයයි.
   (2) දීප්චන්දි තාලය සහ තෙවන අනුතාල ස්ථානයයි.
   (3) ජප් තාලය සහ තෙවන අනුතාල ස්ථානයයි.
   (4) දීප්චන්දි තාලය සහ දෙවන අනුතාල ස්ථානයයි.
   (5) පංජාබි තාලය සහ දෙවන අනුතාල ස්ථානයයි. (...4...)

● අංක **14** සහ **15** ප්‍රශ්න සඳහා පහත සඳහන් තාලානුකූල තබ්ලා පද පෙළ ඇසුරු කරගන්න.

| x                                              | x

| තිරිකිට ධා-තිත් ධා-තිත් ධා --- ++ තිරි කිටධා- තිත්ධා- තිත්ධා– --++ තිරිකිට ධා-තිත් ධා-තිත් | ධා

**14.** ඉහත තබ්ලා පද පෙළින් පෙන්නුම් කෙරෙන තාල අංගය හඳුන්වන්නේ

(1) ඨේකා නමින් ය. (2) කායදා නමින් ය. (3) පල්ටා නමින් ය.
(4) තිහායි නමින් ය. (5) චක්‍රදාර් නමින් ය. (...4...)

**15.** ඉහත තබ්ලා පද පෙළට අදාළ තාලය තෝරන්න.

(1) ජප්තාල් (2) ඒක්තාල් (3) දීප්චන්දි
(4) ත්‍රිතාල් (5) තිලවඩා (...2...)

**16.** සාරංගි, සිතාර්, එස්රාජ් යන සංගීත භාණ්ඩ තුනට ම පොදු වූ ලක්ෂණය තෝරන්න.

(1) අළුවෙත් (bow) වැයීම
(2) පර්දා සහිත වීම
(3) අනුතත්වලින් යුක්ත වීම
(4) මන්කා සහිත වීම
(5) මුහුණත සත්ව හමකින් යුක්ත වීම (...3...)

**17.** | රිග මග රිග මප | මග රිග මප නිනි | ධප මග රිග මප | නිස නිනි ධප මග | වශයෙන් යෙදෙන තානාලංකාරය අයත් තාන වර්ගය හඳුන්වනු ලබන්නේ

(1) සපාට් තාන ලෙසින් ය. (2) කූට තාන ලෙසින් ය.
(3) ශුද්ධ තාන ලෙසින් ය. (4) මිශ්‍ර තාන ලෙසින් ය.
(5) අලංකාරික තාන ලෙසින් ය. (...5...)

**18.** ඛ්‍යාල් සහ ධ්‍රැපද් යන ගායන ශෛලීන් දෙකෙහි ම ඇතුළත් පොදු ලක්ෂණය තෝරන්න.

(1) තානාලංකාර ගායනය (2) මුඛඩාවක් සහිත වීම
(3) මූර්කි බහුලව භාවිත කිරීම (4) වෛතාලයට අනුව ගැයීම
(5) සංචාරී, අභෝග සහිත වීම (...2...)

**19.** පඛාවාජයෙන් සහාය තාල වාදනය සිදු කෙරෙන ගායන ශෛලියක් සහ තබ්ලාවෙන් සහාය තාල වාදනය සිදු කෙරෙන ගායන ශෛලියක් පිළිවෙලින් සඳහන් ව ඇති වරණය තෝරන්න.

(1) ධ්‍රැපද් සහ ධමාර් (2) ධමාර් සහ ඛ්‍යාල්
(3) ඛ්‍යාල් සහ ගසල් (4) ගසල් සහ තරාණා
(5) තරාණා සහ ධ්‍රැපද් (...2...)

**20.** "ගත්කාරි" ක්‍රමයට ආවේණික සංගීත භාණ්ඩ ඇතුළත් වරණය තෝරන්න.

(1) සාරංගි, බටනලා (2) බටනලා, එස්රාජ්
(3) එස්රාජ්, දිල්රුබා (4) දිල්රුබා, සිතාර්
(5) සිතාර්, සරෝද් (...5...)

**21.** පහත ගී පාද සලකන්න.

A - සන්තානම් පල්ලි යන්න ලේ ලකඩි ලේලෝ
B - උඩින් පනින් තල්ල කැඩෙයි
C - ඉපල් පිටින් ගහන අච්ච
D - සාර සදිසි පෙති පේර නෙලන කළ

ඉහත ගී පාද අතුරෙන් ජන ක්‍රීඩා හා සම්බන්ධ වන ගී පාද යුගලය ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D (5) C සහ D (...4...)

22. ආඝාතාත්මක ව ගයනු ලබන ඊකාවක පද පෙළක් ඇතුළත් වරණය කුමක් ද?
   (1) වාරේ වාරේ කියනවා වීනා කොස් වාරේ ද, අඹ වාරේ ද ...
   (2) බැද්දේ ගියා වැලක් සොයා ගන්ට කියා ...
   (3) තව ද ඌරන්, මුවන්, සාවුන්, වෙඩි තියන්නට ...
   (4) අවුරුද්දට නැන්දාගේ ගෙදර යන්න කදමල්ලක් බැන්දා සේ ...
   (5) කොළඹ සිටන් හා තම්දෙන තානම් ...

(5)

23. "කලුළු ගංගා තුරුළු කරගෙන එතෙර වන්නට රුදුරු කතරින්" වශයෙන් යෙදෙන ගී පාදයෙහි වචනාර්ථයට හානි නො වන ලෙස ගැයිය හැකි වඩාත් ම යෝග්‍ය තිත් තාලය වනුයේ
   (1) මැදුම් තනිතිත ය.
   (2) සුළු මැදුම් දෙතිත ය.
   (3) මැදුම් මහ දෙතිත ය.
   (4) සුළු මහ දෙතිත ය.
   (5) දෙමැදුම් මහ තුන්තිත ය.

(3)

24. වරම් ගී පිළිබඳ ව වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ගී තනු අනාඝාතාත්මකව ගයනු ලැබේ.
   (2) වැඩි වශයෙන් පිරිමි පාර්ශ්වය විසින් ගයනු ලැබේ.
   (3) ගොයම් කැපීමේ දී සහ ගොයම් පෙළීමේ දී ගයනු ලැබේ.
   (4) සංකීර්ණ තනු භාවිත වේ.
   (5) වියත් බස යොදා රචනා කර තිබේ.

(3)

25. මහනුවර යුගයේ රජවාසලෙහි පවත්වා ගෙන ගිය ආයතන පහ අතුරෙන් විවිධ රංගන හා නළු නාටක ආදිය සඳහා වෙන් වූ ආයතනය කුමක් ද?
   (1) කවිකාර මඩුව
   (2) සිංහක්කාර අංශය
   (3) තම්බෝරු පුරම්පෙට්ටුකාර අංශය
   (4) නැටුම් ඉලංගම
   (5) වාහල ඉලංගම

+ ~~5~~ 4 (......)

26. ගායන ශිල්පී සනත් නන්දසිරි විසින් ගයන ලද 'සිනහ නගන්නී ලැසි ලැසි ගමනින් එන්නී' ගීතයේ තනුව නිර්මාණය සඳහා පාදක කරගෙන ඇති නාද රටාව ඇතුළත් රංග ශෛලිය තෝරන්න.
   (1) සොකරි
   (2) කෝලම්
   (3) නූර්ති
   (4) නාඩගම්
   (5) නව නාට්‍ය

(1)

27. වර්ෂ 1967 දී තිරගත වූ විශිෂ්ට සිනමා රූපී සංගීතයෙන් හෙබි, හින්දුස්තානි හා බටහිර සංගීත ක්‍රමශිල්ප එකමුතුවෙන් හැඩ ගැන්වුණු "සිහිඳු සුදූ මුතු තලාවේ ..." ගීතයෙහි තනු හා සංගීත රචකයා තෝරන්න.
   (1) ඩබ්ලිව්. ඩී. අමරදේව
   (2) බී. එස්. පෙරේරා
   (3) ආර්. ඒ. චන්ද්‍රසේන
   (4) සෝමදාස ඇල්විටිගල
   (5) පී. එල්. ඒ. සෝමපාල

(4)

28. බටහිර සංගීතයේ C note (ස්වරය) පෙරදිග සංගීතයේ 'ස' ස්වරය ලෙස සැලකීමේ දී සියලු ස්වර ශුද්ධ ව යෙදෙන බටහිර නැචුරල් මයිනර් ස්කේලය (Natural Minor Scale) තෝරන්න.
   (1) A minor
   (2) B minor
   (3) C minor
   (4) D minor
   (5) E minor

(1)

29. අපරදිග සංගීත ප්‍රස්තාරකරණයේ දී භාවිත කෙරෙන ප්‍රකාශන සංකේත අතුරෙන් ඉතාමත් වැඩි හඬ (very loud) සහ ඉතාමත් අඩු හඬ (very soft) සඳහා යෙදෙන නිවැරදි ප්‍රකාශන සංකේත තෝරන්න.
   (1) ff / p
   (2) f / pp
   (3) ff/ pp
   (4) mf / mp
   (5) mf / p

(3)

CS CamScanner

**30.** පහතින් දක්වා ඇත්තේ "නිල් අහස් තලේ අගේ" ගීතයෙහි ආරම්භක ස්වර පාද දෙකකි. මෙහි දෙවන ස්වර පාදයට ගැළපෙන Counter-part එක දැක්වෙන වරණය තෝරන්න.

| ග – ම | ප – ග | ම – ග | රි – – |
| ග – ම | ප – ධ | නි – – | – – – |

(1) | ප – – | ග – රි | ග – – | – – – |
(2) | ප – – | ග – ම | රි – – | – – – |
(3) | ධ – – | නි – ප | ධ – – | – – – |
(4) | රි – – | ප – – | ප – – | – – – |
(5) | නි̣ – – | ස – – | ග – – | – – – |

(..2..)

- අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**31.** භාරතීය සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව ෂෙහනායි භාණ්ඩය ........සුෂිර........ වාද්‍ය වර්ගයටත්, පඛාවාජ් භාණ්ඩය ........අවනද්ධ........ වාද්‍ය වර්ගයටත් අයත් වේ.

**32.** උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය සඳහා යොදා ගනු ලබන බටනලාවෙහි ස්වර උත්පාදක සිදුරු 06 ම එකවර වසා පිඹීමෙන් ....ප.... ස්වරය ද, පිඹින සිදුරට ආසන්නයේ ම පිහිටි සිදුරු තුන පමණක් එකවර වසා පිඹීමෙන් ....ස.... ස්වරය ද උත්පාදනය වේ.

**33.** උස්තාද් අම්ජාද් අලිඛාන්, ........සරෝද්........ නම් සංගීත භාණ්ඩය වාදනය සඳහා ද පණ්ඩිත් නිඛිල් බැනර්ජී, ........සිතාර්........ නම් සංගීත භාණ්ඩය වාදනය සඳහා ද සුප්‍රසිද්ධ ය.

- අංක **34** සිට **36** දක්වා පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A - කෝමල ධෛවතය ආන්දෝලිත වන සම්පූර්ණ ජාති රාගයකි.

B - රිෂභය වක්‍ර ව සහ උච්ච කෝමල ගාන්ධාරය විවාදී ව යෙදෙන රාගයකි.

C - පරමේල ප්‍රවේශක වර්ගයෙහිලා සැලකෙන රාගයකි.

**34.** A අක්ෂරයෙහි විස්තරයෙන් පිළිබිඹු වන රාගයේ නම ........භෛරව........ වන අතර එම රාගය හා සමප්‍රකෘති වනුයේ ........කාලිංගඩා........ රාගයයි.

**35.** B අක්ෂරයෙහි විස්තරයෙන් පිළිබිඹු වන රාගයේ නම ........දේස්........ වන අතර එහි ගාන සමය වන්නේ ........රාත්‍රී දෙවන........ ප්‍රහරයයි.

**36.** C අක්ෂරයෙහි විස්තරයෙන් පිළිබිඹු වන රාගයේ නම ........ජයජයවන්ති........ වන අතර........රි/ රිෂභ........ ස්වරය එම රාගයෙහි වාදී ස්වරය වේ.

**37.** දීම්ත, දෙරෙ, දානි ආදී අක්ෂරවලින් ප්‍රබන්ධිත උතුරු ඉන්දීය ගායන ශෛලියක් වන ........තරානා........ ගායන ශෛලියෙහි අංග ලක්ෂණ ද ඇතුළත් ව අංග හතරකින් යුතුව ........චතුරංග........ නම් ගායන ශෛලිය ප්‍රබන්ධිතය.

● අංක 38 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා පහත සඳහන් ඡේදය කියවා ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

**ශාරදා** විසින් තාම්පුරාව වයමින්, භෛරව් මේලගත ඖඩව ජාති රාගයකින් විලම්බලය ඛ්‍යාල් ගායනයක් සම්ප්‍රදායානුකූල ව ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා **සංඛ** විසින් වැයූ තාලයෙහි ඨේකාවෙහි "තිරිකිට" අවනද්ධාක්ෂර ඇතුළත් නො වී ය. සහාය ස්වර වාදනයෙහි යෙදුන **තාරක** විසින් එම රාගයට අයත් සියලු ම ස්වර උත්පාදනය සඳහා භාවිත කරන ලද්දේ ස්වර පුවරුවෙහි කළු යතුරු (black keys) පමණි.

38. මූලික ශ්‍රැතියට අනුකූල ව, තාම්පුරාවේ තත් **හතර**, මන්ද්‍ර මධ්‍යමය / ම ......................., මධ්‍ය ෂඩ්ජය, මධ්‍ය ෂඩ්ජය සහ මන්ද්‍ර ෂඩ්ජය වශයෙන් වූ ස්වර පිළිවෙල අනුව සුසර කර ගත් ශාරදා විසින් ගයන ලද්දේ මාල්කෞන්ස් ....................... රාගයයි.

39. සංඛ විසින් තබ්ලා ....................... නමැති තාල වාද්‍ය භාණ්ඩයෙන් ත්‍රිතාල් / රූපක් ....................... නම් තාලය වයන ලදී.

40. තාරක විසින් සහාය වාදනයට යොදා ගත් හාමෝනියම්/සර්පිනා ....................... නම් සංගීත භාණ්ඩයෙහි නි / නි / $B^b$ කෝමල නිෂාදය ....................... ස්වරය (note එක) මත රාගයෙහි ශ්‍රැති ස්වරය (ෂඩ්ජය) පිහිටුවා වයන ලදී.

41. | $\hat{}$ගුං – | $\acute{}$දෙ ග ත | $\hat{}$ග ත් | $\acute{}$ත ගුං – | වශයෙන් යෙදෙන බෙර පදය වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩය පහතරට බෙරය /ගා/යක්/රුහුණු බෙරය ....................... නම් වන අතර ගැටබෙරයෙන් | $\hat{}$දොං – | $\acute{}$දොං – ජිං – | $\hat{}$ජිං – | $\acute{}$ග ජි ග ත | ලෙස බෙර පදය වයනු ලබන්නේ සැවුලා ....................... වන්නම සඳහා ය.

42. "උදයට පායන හිරු දෙවියන්ටයි" වශයෙන් යෙදෙන ගැමි ගී පාදයේ, ගීමත් ගණන 24 ....................... ක් වන අතර සඳැස්මත් ගණන 16 ....................... ක් වේ.

43. ප්‍රථම සිංහල නූර්තියෙහි නම රොමලින් හෙවත් දිව්‍ය කුසුම/ රොලිනා ....................... වන අතර එහි නිෂ්පාදකවරයා වූයේ සී . දොන් බස්තියන් ....................... මහතා ය.

44. "උදුම්බරා හිනැහෙනවා" වශයෙන් ආරම්භක පද යෙදෙන ගීතය බඹරු ඇවිත් ....................... චිත්‍රපටයෙහි ඇතුළත් ගීතයක් වන අතර, එහි සංගීත නිර්මාණය කර ඇත්තේ ප්‍රේමසිරි කේමදාස ....................... විසිනි.

45. ඛ්‍යාල් ගායන ශෛලියට අදාළ ව සිංහල බසින් ප්‍රබන්ධිත ගීත ඇතුළත් 'ඛ්‍යාල ගීත' නම් ග්‍රන්ථය ආනන්ද ජයසිංහ ....................... මහතා විසින් රචනා කර වර්ෂ 1962 හි දී පළ කරන ලද අතර, හින්දුස්ථානි සංගීතය පිළිබඳ ව වර්ෂ 1967 දී සිංහල බසින් පළ කර ඇති 'සංගීත' නම් වූ ග්‍රන්ථය ප්‍රේමවංශ හපුවලාන ....................... විසින් රචනා කරන ලදී.

46. අනුකාරක සිංහල චිත්‍රපට ගීතයක් වන සාගර හිමිය සොයා ....................... වශයෙන් පද යෙදෙන ගීතයෙහි තනුව යොදා ගෙන ඇත්තේ ශ්‍රී 420 ....................... නම් හින්දි චිත්‍රපටයේ ඇතුළත් **රමෛයා වස්තාවයා** ලෙස පද ආරම්භ වන හින්දි ගීතයෙනි.

47. බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව, "Woodwind instruments" යටතෙහි ගත්කළ single reed වර්ගයට සැක්සෆෝන්, ක්ලැරිනට් ....................... වැනි සංගීත භාණ්ඩ අයත් වන අතර, ඕබෝ (Oboe) නමැති සංගීත භාණ්ඩය අයත් වන්නේ ඩබල් රීඩ්/Double Reed ....................... නම් වර්ගයට ය.

CamScanner

**48.** මිනිස් ශ්‍රවණේන්ද්‍රියට ගෝචර වන කම්පන සංඛ්‍යාත පරාසය වන්නේ හර්ට්ස් 20 සිට හර්ට්ස් 20,000 දක්වා ය. නාද තරංගවල රටා සහ හැඩයන් හඳුනා ගැනීමට ඔසිලස්කෝප් නම් වූ උපකරණය භාවිත කෙරේ.

**49.** කණ්ඩායම් ගීතයක් වන 'මංගෝ කළු නැත්දේ' ගීතය මූන්ස් ටෝන් නම් වූ සංගීත කණ්ඩායම විසින් ද, 'ගමෙන් ලියුමක් ඇවිල්ලා' ගීතය ක්ලැරන්ස් විජේවර්ධන ප්‍රමුඛ සුපර් ගෝල්ඩන් චයිම්ස් නම් වූ සංගීත කණ්ඩායම විසින් ද ප්‍රථමවරට ඉදිරිපත් කරන ලදී.

**50.** හොවාර්ඩ් ගාඩ්නර් නමැති මනෝ විද්‍යාඥයා විසින් ඉදිරිපත් කරන ලද 'බහුවිධ බුද්ධිය' පිළිබඳ සිද්ධාන්තයේ නිපුණතා අටම සංගීත විෂයයට ඇති සබඳතා පෙන්නුම් කළත්, සුවිශේෂී වශයෙන් සංගීතය හා බැඳි නිපුණතාවය සංගීත රිද්මයානුකූල බුද්ධිය ලෙස හඳුන්වා ඇත.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

**පෙරදිග සංගීතය II**
கீழைத்தேய சங்கீதம் II
Oriental Music II

**54 S II**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය** - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
* I කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, II කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු** 20 බැගින් ලැබේ.)

## I කොටස

1. පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර සංගතීන් ය.

A - ස ග ම ධ ප, ග ම ධ නි ස්
B - රි ම ප ධ ප, ම ප ධ ධ ස්
C - නි ස රි ග රි, ග ම ප නි ස්

(i) ඉහත රාග **තුන** හඳුනා ගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිවෙළින් නම් කර A හි සඳහන් ස්වර සංගතිවලින් පිළිබිඹු වන රාගයෙහි වාදී සහ සංවාදී ස්වර ලියන්න. (ලකුණු 05 යි.)

(ii) එම රාග තුනෙන් **එක්** රාගයකට අදාළ ඛ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි ස්ථායි කොටස තාල සංකේත ද සහිත ව ස්වර ප්‍රස්තාර කර **මාත්‍රා 8කට නො අඩු** තානාලංකාර **දෙකක්** ලියන්න. (ලකුණු 07 යි.)

(iii) ඉහත B හි සඳහන් ස්වර සංගතිවලින් පිළිබිඹු වන රාගයට අදාළ ආලාප ඛණ්ඩයක් **ස්වර 30කට නො අඩු** වන සේ ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

(iv) ඉහත C හි සඳහන් ස්වර සංගතිවලින් පිළිබිඹු වන රාගයට අදාළ ථාටය, ගාන සමය, රාග ජාතිය සහ මුඛ්‍යාංගය යන කරුණු ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

* තාල සංඥා පිළිවෙළට තිබිනානම් ඇත (x 2 0 3)

2. A - ජෞනපුරි B - තිලක්කාමෝද් C - කාලිංගඩා

(i) ඉහත රාග තුනෙන් කැමති එක් රාගයකින් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක අන්තරා කොටසකට සුදුසු ස්වර රචනාවක් ත්‍රිතාලයෙහි ආවර්ත දෙකකට සීමා වන ලෙස නිර්මාණය කර ස්වර ප්‍රස්තාර කරන්න. ඒ සඳහා සුදුසු තානාලංකාරයක් ද **මාත්‍රා 8කට නො අඩු වන ලෙස** ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

(ii) ඉහත A සහ B හි සඳහන් රාග දෙකට සමප්‍රකෘති වන රාග **දෙක** තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂර ඉදිරියෙන් ලියන්න. (ලකුණු 02 යි.)

(iii) නිර්දේශිත එක් සමප්‍රකෘති රාග යුගලයක් තෝරා ගෙන එම රාග දෙකෙහි සමානතා **තුනක්** සහ අසමානතා **තුනක්** නිදර්ශන සහිත ව පෙන්නුම් කරන්න. (ලකුණු 06 යි.)

(iv) දීප්චන්දි තාලයෙහි ඨේකාව නියමිත තාල සංකේත සහිත ව **සම ලයෙන්** සහ **දෙගුණ ලයෙන්** යුතු ව ප්‍රස්තාර කර, එම තාලයෙහි මාත්‍රා සංඛ්‍යාවට සමාන මාත්‍රා සංඛ්‍යාවකින් යුතු වෙනත් තාලයක් නම් කරන්න. (ලකුණු 06 යි.)

3. පහත A, B සහ C යටතෙහි දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අදාළ පල්ටා තුනකි.

**A**

ස ග̲ ම ග̲ රි ස

ස ග̲ ම ධ ම ග̲ රි ස

ස ග̲ ම ධ නි̲ ධ ම ග̲ රි ස

ස ග̲ ම ධ නි̲ ස̇ නි̲ ධ ම ග̲ රි ස

**B**

ස රි ම ප, ම ග රි ග

ස රි ම ප ධ ප ම ප, ම ග රි ග

ස රි ම ප, නි̲ නි̲ ධ ප, ම ප ම ග රි ග

ස රි ම ප නි ස̇ නි̲ නි̲ ධ ප ම ප ම ග රි ග

**C**

ග ප රි ග ස රි

ග ප නි ප ග ප රි ග ස රි

ග ප ස̇ නි ස̇ ප නි ප ග ප රි ග ස රි

ග ප නි ස̇ ග̇ රි̇ ග̇ ස̇ නි ස̇ ප නි ග ප රි ග ස රි

(i) ඒ ඒ පල්ටාවෙන් පිළිබිඹු වන රාග හඳුනා ගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග වෙන වෙන ම පිළිවෙළින් නම් කර ඒ ඒ රාගවල ආරෝහණ සහ අවරෝහණ ස්වර ලියන්න. (ලකුණු 09 යි.)

(ii) එම රාග තුනෙන් කැමැති රාගයකට අදාළ ඛ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි ස්ථායි කොටස තාල සංකේත ද සමග ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 05 යි.)

(iii) එක් එක් පල්ටාවෙහි ස්වර යෙදීමේ ස්වරූපය අනුව එම පල්ටා විවිධ තානාලංකාර වර්ග නිර්මාණයට පදනම් වන බව පෙනේ. ඉහත A සහ C යන පල්ටා දෙකෙහි ස්වර රටාවන්ට ගැළපෙන ආකාරයට නිර්මාණය වන තාන වර්ග **දෙකක්** අදාළ ඉංග්‍රීසි අක්ෂර සමග නම් කර, කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04 යි.)

(iv) ඉහත B හි සඳහන් පල්ටාව ආශ්‍රයෙන් තානාලංකාරයක් නිර්මාණය කර, (මාත්‍රා 16කට **නො අඩු වන** සේ) ලියන්න. (ලකුණු 02 යි.)

## II කොටස

4. පහත දැක්වෙනුයේ ශාන්තිකර්ම ගීත කිහිපයක මුල් පද මාලාවන් ය.

A - අන්ද ගුවන් හැර නැංග අසුන් පිට දෝ වැඩ ඉන්නේ
B - ගුණ දැනේ බෝසත් අනේ පෙර ඉපදුනේ
C - සුරතට රැගෙන පන්දම් යාගෙට ඇදුරා
D - එර්දිවෙලා උඩු ගුවනේ වඩින්නේ
E - හිස මුව තුළ බෙල්ල දෙවුර

(i) ඉහත A සිට E තෙක් එක් එක් ගීතය අයත් වන සම්ප්‍රදාය අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග නම් කර, ශාන්තිකර්ම යන්නෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

(ii) A හි දැක්වෙන ගීත කොටසෙහි පදමාලාව නියමිත තිත් තාලය අනුව ගී පද ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04 යි.)

(iii) B හි දැක්වෙන ගීතයට අදාළ තිත් තාලය නම් කර, එම බෙර පදය (ගීතය අයත් සම්ප්‍රදායට අනුව) තිත් සංඥා සහිත ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iv) ප්‍රශස්ති සහ වන්නම් සම්ප්‍රදායන් දෙක අතර, සමානතා **තුනක්** සහ අසමානතා **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 05 යි.)

CamScanner

5. (i) සොකරි හා කෝලම් රංග ශෛලීන් දෙකෙහි රංග ලක්ෂණ **තුන** බැගින් වෙන වෙන ම ලියන්න. (ලකුණු 06 යි.)

(ii) නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායන්හි සංගීතමය ලක්ෂණ පිළිබඳව කරුණු **තුනක්** යටතේ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 06 යි.)

(iii) දොහොරාව සහිත නිර්දේශිත නූර්ති ගීතයක දොහොරාවට අදාළ ගී පද කොටස ලියන්න. (ලකුණු 04 යි.)

(iv) පහත කරුණු **දෙකක්** පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

- පොතේ සිංදුව
- මුද්‍රප්පදය
- තානම
- අගහාරං

(ලකුණු 04 යි.)

## III කොටස

6. (i) පහත වගුවෙහි දැක්වෙන බටහිර ස්වර සංඝාත (Chords) සඳහා නියමිත ස්වර, අදාළ සංඝාත (Chords) ඉදිරියෙන් ලියන්න (වගුව පිළිතුරු පත්‍රයෙහි පිටපත් කරගෙන පිළිතුරු ලියන්න).

| | බටහිර ස්වර සංඝාත (Chords) | අයත් ස්වර |
|---|---|---|
| උදා:- | (1) C Major | ස ග ප (C E G) |
| | (2) E flat Major | |
| | (3) D Minor | |
| | (4) C Minor $7^{th}$ | |
| | (5) C Major $7^{th}$ | |

(ලකුණු 04 යි.)

(ii) පහත සඳහන් අපරදිග සංගීත ස්වර ප්‍රස්තාරයේ අංක ① සිට ⑥ දක්වා පෙන්නුම් කර ඇති ප්‍රකාශන සංකේත අතරින් **හතරක්** නම් කර, එම ප්‍රකාශන හතර කෙටියෙන් හඳුන්වන්න.




(ලකුණු 08 යි.)

(iii) පහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට අනුව පෙරළා ප්‍රස්තාර කරන්න. (අපරදිග C ස්වරය, ෂඩ්ජ ස්වරයට සමාන ලෙස සලකන්න.)



(ලකුණු 04 යි.)

(iv) පහත දක්වෙන පෙරදිග සංගීත ස්වර ප්‍රස්තාරය අපරදිග සංගීත ක්‍රමයට අනුව පෙරළා ප්‍රස්තාර කරන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබට සපයා ඇති සංගීතය පිළිබඳ අත් පිටපත (Music Manuscript) යොදා ගත හැක. (ෂඩ්ජ ස්වරය, අපරදිග සංගීත C ස්වරයට සමාන ලෙස සලකා ප්‍රස්තාර කරන්න.)

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගුප | ධ | නි | + | ස්නි | ධප | ම | – | – | – | ග | ම |
| ධ | ධ | පධ | නිධ | ස්නි | රිස් | ගුම් | ප් | ම්ගු | රි | ගු | – |

(ලකුණු 04 යි.)

7. (i) රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත ව නිර්මාණය වී ඇති ප්‍රචලිත සිංහල සරල ගීත තුනක්, අදාළ රාග ද සමග නම් කර, එම **එක් ගීතයක** ඇතුළත් රාගධාරී සංගීතමය ගුණාංග **තුනක්** ගෙන හැර දක්වන්න. (ලකුණු 06 යි.)

(ii) මෙරට චිත්‍රපට සංගීත ඉතිහාසයේ මුල් යුගයේ (වර්ෂ 1947-1957 දක්වා කාලය තුළ) චිත්‍රපට සංගීත නිර්මාණය සඳහා දායක වූ ඉන්දීය සංගීත අධ්‍යක්ෂවරයෙකු හා ලාංකේය සංගීත අධ්‍යක්ෂවරයෙකු බැගින් නම් කර, නිර්දේශිත අනුකාරක චිත්‍රපට **දෙකක්** හා ගීත **දෙකක්** නම් කරන්න. (ලකුණු 06 යි.)

(iii) "ශ්‍රී ලංකාවේ සරල සංගීතයේ විකාශය සඳහා කණ්ඩායම් සංගීතය බෙහෙවින් දායක වී ඇත." මෙම කියමන සනාථ කිරීම සඳහා **ලොස් කැබෙලෙරෝස්** සංගීත කණ්ඩායමේ දායකත්වය පිළිබඳ පහත කරුණු යටතෙහි ඇගයීමක් කරන්න. (ලකුණු 04 යි.)

- නිර්මාණය වී ඇති ගීත
- ගායක/ගායිකාවන්

(iv) පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය මෙරට ව්‍යවහාරික සරල සංගීත ප්‍රස්තාරකරණයේ දී යොදා ගනු ලබන සංකේත භාවිත කරමින් නැවත ලියන්න.
(යොදාගත හැකි සංකේත: Repetition marks, Sign-to-sign, Time signature ආදියයි.)

| | | | |
|---|---|---|---|
| ස ස රි ග | ම – ග රි | ග – රි ස | රි – ස – |
| රි රි ග ම | රි රි ග ම | රි රි ග ම | ප– මග රි– ග+ |
| රි රි ග ම | රි රි ග ම | රි රි ග ම | ප– මග රි– ග+ |
| ස ස රි ග | ම – ග රි | ග – රි ස | රි – ස – |

(ලකුණු 04 යි.)

8. පහත සඳහන් (i) සිට (vi) දක්වා කොටස් අතුරෙන් **හතරක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) රාග 'ගාන සමය' සිද්ධාන්තයට අනුව පහත සඳහන් කාණ්ඩවලට අදාළ රාග ගායනය කිරීමට නියමිත කාල සීමාවන් අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග වෙන වෙන ම ලියන්න.

(a) පූර්වාංගවාදී රාග
(b) උත්තරාංගවාදී රාග
(c) කෝමල රි, ධ සහ තීව්‍ර ම ස්වර යෙදෙන රාග
(d) උදය සන්ධි ප්‍රකාශ රාග
(e) ශුද්ධ රි සහ ධ ස්වර යෙදෙන රාග (ලකුණු 05 යි.)

(ii) "ලතින් අමෙරිකානු සංගීතය හා බැඳී පැවති Reggae වැනි තාල රටා අප්‍රිකානු සංගීතයෙහි පැවති රිද්ම රටා වේ". නිර්මාණ සංගීතයේ දී යොදා ගැනෙන එවැනි තවත් තාල රටා **තුනක්** නම් කර, ඉන් තාල රටා **දෙකක්** පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි.)

(iii) පරිගණකය ඇසුරෙන් සංගීත ඛණ්ඩ නිර්මාණය හා සංගීත සංයෝජනය කිරීමේදී උපයෝගී වන පරිගණක මෘදුකාංග **දෙකක්** (software) සහ දෘඩාංගයක් (hardware) නම් කර, ඒවායින් සිදු වන කාර්යයන් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි.)

(iv) බටහිර සංගීත සංධ්වනියක (symphony) විශේෂ ලක්ෂණ **පහක්** පෙළගස්වන්න. (ලකුණු 05 යි.)

(v) "මෙහෙ ගී තුළින් සන්නිවේදනය ද සිදු ව ඇති බවට සාක්ෂි හෙළිදරව් වේ." අනාසාතාත්මක මෙහෙ ගී වර්ග **දෙකක්** නිදසුන් ලෙස ගෙන ඉහත කරුණ පිළිබඳ කෙටියෙන් අදහස් දක්වන්න. (ලකුණු 05 යි.)

(vi) උත්තර භාරතීය සහ දක්ෂිණ භාරතීය සංගීත පද්ධති දෙක අතර සමානතා **තුනක්** සහ අසමානතා **දෙකක්** නිදර්ශන ද සහිත ව පෙළගස්වන්න. (ලකුණු 05 යි.)

* * *